*සන්නස 2013 ජූලි කලාපයෙන් ......*

වත්මන් තරුණ පරපුර මෙන්ම බාල දරු දැරියන් අතර ද යහපත අයහපත වෙන් කර හඳුනාගැනීමට අපහසු තත්වයක පසු වන්නන් විරල නොවන බව කිව යුතුය. ශ්‍රී ලාංකික ගැමි සංස්කෘතිය තුළ තම ජීවිතය තරමට සෙස්සන්ගේ ජීවිතය ද අගය කරන්නට අපට කියා දුන් වාර අනන්තය. තම නිවසේ හා පවුලේ කෙනකු රෝගී වූ විටක හෝ හදිසි අනතුරක්, අබාධයක් සිදු වූ විටක සෙසු නිවැසියන් කොතරම් නම් ඒ ගැන උනන්දුවකින් හා අවධානයකින් කටයුතු කරනු ඇද්ද යන්න අමුතුවෙන් කිව යුතු නොවේ. එපරිද්දෙන්ම, අසල්වැසි නිවසක වැසියකු එවන් තත්වයකට පත් වූ විටකදී වහා ක්‍රියාත්මක වී ඔවුන්ගේ උපකාරය සඳහා යොමු වීමට අපේ ගැමි ජනතාවට අමුතුවෙන් කියා දිය යුතු නොවීය. කෘෂිකාර්මික කටයුතු වලදී මෙන්ම ගෙදර දොර, විවිධ අවශ්‍යතාවලදී ද අන්‍යොන්‍ය වශයෙන් දැඩි සහයෝගයකින් කටයුතු කිරීමට එම සමාජ පසුබිම අපට ඉඩ සලසා දුනි.

අපේක්ෂා කෙරෙනුයේ බාලයන් ගැන ආදරයකි, දයාවකි, සෙනෙහසකි. ඒ සමග ආරක්ෂක හැඟීමකි. එසේ වුවද අද අපට අසන්නට ලැබෙන ඇතැම් පුදුමාකාර සිදුවීම් අනුව මෙම තත්වය හැම විටම එලෙසින්ම නොපවතිනු ඇත යන සැකය නිරායාසයෙන් අප සිත්වලට නැගෙනු ඇත. සිය පවුලේම වැඩිහිටි ඥාතීන් දරුවන්ගේ ආරක්ෂකයන් යනු වෙනුවට දරුවන්ගේ විනාශය සිදු කරන අපරාධකරුවන් වන තරමට ඇතැම් තත්වයන් දුරදිග ගොස් ඇති බව ද පෙනේ. විෂම වූ මානසික තත්වයන්ට පත් වී සිටින්නන්ගෙන් දරුවන් රැකගැනීම ද අද වැඩිහිටියන්ගේ මෙන්ම මුළු සමාජයේ ද වගකීමක් වී ඇත.

දරුවන් මෙලොවට බිහි කරන දෙමාපියන් සතු පරම යුතුකම වනුයේ ඔවුන් යහපත් පුද්ගලයින් බවට පත් කරලීමටය. තමන්ට ආවේණික සංස්කෘතියට අයත් වන සාරධර්මවලට දරුවන් හුරු පුරුදු කර ලීම දෙමාපිය වගකීමකි. නූතන සංකීර්ණ සමාජය තුළ හැදෙන වැඩෙන



සම්මානිත මහාචාර්ය
**කුසුමා කරුණාරත්න**

යොමු කරන අංශයක් නම් ඖචිත්‍යයයි, නැතහොත් උචිත බවයි. සාමාන්‍ය ජීවිතයේදී වුව මෙය බෙහෙවින් අදාළ වන්නකි. එදා ගැමි සංස්කෘතිය සමග ජිවත් වූ අද වැඩිහිටියන් වන අප ලද මග පෙන්වීම අනුව ඇඳුම් පැළඳුම් විෂයෙහි, විශේෂයෙන්ම ගැහැනු දරුවන්, තරුණියන් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කෙරිණ. කාව්‍යශේඛරයේ සඳහන් වන පරිදි, එදා පැවති බමුණු මතවලට ද, අනුව

සුන්දරත්වය හුදෙක් ඇඟට හිරවන සේ අඳින ඇඳුමෙන් වත්, නොසැලකිලිමත් ලෙස මුදා හැරගෙන සිටින කේශ කලාපයෙන් වත්, එසේත් නැතහොත් මුහුණ මත තැවරූ සායම්වලින් හෝ දෙතොල් හා නිය පෙළ දිදුලවන වර්ණාලේපවලින් හෝ මනින්නට නොහැකි බව අමුතුවෙන් කිව යුතු නොවේ. සිංහල සන්දේශ කවීහු කාන්තා රුව වර්ණනයේදී ඉස්මතු කර දැක්වූයේ සඳුන්

# එදා අප උගත් යහගුණ අද බාල පරපුරට අකැපද? 2

නූතන නාගරික සමාජය තුළ, ගලින් හෝ ගඩොලින් වට වූ උස් තාප්පවලට මැදි වී සුවපහසු නිවෙස්වල දිවි ගෙවන්නන්ට අසල්වැසි නිවසක කෙනකුගේ දුක හෝ සැප ගැන සොයා බැලීමක් තබා ඒ ගැන සිතීමකට වත් ඉඩ ප්‍රස්තා නොමැත. ලෝකයේ දියුණු රටවල, බොහෝ අපරදිග රටවල වර්තමානයේදී සිදු වන්නේ ද මේ දේමය. වැඩිහිටි කාන්තාවක් හෝ ස්වාමි - භාර්යා දෙදෙනකු හුදකලාව ජීවත් වෙමින් සිටින අතර ඔවුන් හදිසියේ අනතුරකට, රෝගයකට ලක් වී මිය ගියද අසල්වැසියන්ට ඒ පිළිබඳ දැනගන්නට ඉඩ නොලැබී යන අවස්ථා ගැන ද අපට පුද්ගලයන්, විශේෂයෙන්ම වැඩිහිටියන් හුදෙකලා වීමකි. මිනිස් ජීවිතයේ අගය හා වටිනාකම බාල වියේ සිට දරුවන්ගේ මනසට ඇතුළු නොකිරීම අද සමාජය මුහුණ දෙන විවිධ ප්‍රශ්නන හා ගැටලුවලට හේතු සාධක වී ඇත.

මන්දස්මිතය, නැතහොත් මඳ සිනාව පුද්ගලයකුගේ මුහුණට, පෙනුමට අමුතු සුන්දරත්වයක් ලබා දෙන බව එදා අපේ වැඩිහිටියන්ගෙන් අපි අසා ඇත්තෙමු. ගමේ ගොඩේ සිට දෛනික ජීවිත ගෙවූ අපේ වැඩිහිටියෝ සුහද සන්නිවේදනය මගින් අන්‍යොන්‍ය සම්බන්ධතා තර කරගනිමින් කල් යැවූහ. කුඹුරට බැස සිටින ගොවි මහතාට, තමන් දන්නා හඳුනන වෙනත් ගැමියකු හොඳින් ඇඳ පැළඳගෙන නියර දිගේ යනු දිස් වන විට, සිය කාර්යය මඳකට නතර කොට, "සියදෝරිස් මාමේ, බෑරක්ද ?" යන ප්‍රශ්නය නැගීම අරුමයක් නොවේ. නිතර දෙවේලේ සාමාන්‍ය ඇඳුමින් සැරසී සිටින තම අසල්වැසියකු උඩුකය වසා බැනියම හැඳ, කරේ ලේන්සුවක් හෝ තුවායක් දමාගෙන යන්නේ විශේෂ කාර්යයක් සඳහා වන විශේෂ ගමනක් බව ගොවි මහතා හොඳින් දනියි. එසේ වුවද, ඒ ගැන සිතා නිහඬව සිටීම ඔහුට තරම් නොවන්නකි. එබැවිනි, ඔහු ඉහත දැක්වූ අන්දමේ ප්‍රශ්නයක් නගන්නේ. එමඟින් සිදු වන යහපත ගැමියෝ හොඳින් දැන සිටියහ. එම සුහඳ වදන් හුවමාරුවන් ඔවුන් අතර පවත්නා යහපත් සබඳතාව තව තවත් තර වන ආකාරය අපේ වැඩිහිටියෝ හොඳින් දැන සිටියහ. එම වචන සමඟම මුවින් මතු වන සිවා රැල්ල ද සුහද මිනිස් සබඳතාවලට මග පාදයි. පිරිසිදු හදවතකින් නැගී එන අවංක සිනාව ගැමියන් සැබවින්ම අගය කළ දෙයකි. කෙනකුගේ මුහුණට එක් කරන ප්‍රිය මනාප පෙනුම, සීදේවි බව හා ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ අපි එදා හොඳින් දැන හඳුනාගෙන සිටියෙමු. විශේෂයෙන්ම වැඩිහිටියකු කුඩා දරුවකු දෙස බලන්නේ සෙනෙහසින් පිරුණු හැඟීමකිනි. ඊට ප්‍රතිචාර දක්වන බාල දරු දැරියන් මුවඟට සිනාවක් මතු වීම ද නිරායාසයෙන් සිදු වූවකි.

එසේ වුවද වත්මන් සමාජයේ සිදු වෙමින් පවතින වෙනස්කම් සමග එම තත්වය ඒ අයුරින් පැවතීම කොතෙක් දුරට අපේක්ෂා කළ හැක්කක්ද ? වැඩිහිටියෙකුගෙන් හැම විටම දරුවන් සරල ජීවන රටාවකින් ඈත් වෙමින් වන අයුරු අපට දැකගත හැකිය. සරල බව සමග අල්පේච්ඡ ගුණය ද අප සිතන පරිදි කෙනකු වෙත තිබිය යුතු ආභරණ වැනිය. මෙයින් අදහස් වන්නේ අල්පේච්ඡතාවට නැඹුරුව ජිවත් වීම යනු නූතන විලාසිතා බැහැර කරමින්, ආර්ථික දියුණුවක් ගැන නොසිතා හුදෙක් ලද දෙයින් සතුටුව, හෙමින් යන ඉදිරිගමනකට යොමු වීමට නොවේ. කාලයකට අනුගත වෙමින් සිය දියුණුව හා සංවර්ධනය ළඟා කරගැනීමට අපේ තරුණ පෙළට මෙන්ම බාල පරපුරට අපි මග පෙන්විය යුතු වෙමු. එසේ වුවද අප සතු සාරධර්මවලින්



තොරව, ඒවාට පටහැනිව ලබන දියුණුව හා ඒ සමග ගෙවන ජීවිතය අත්‍යාවශ්‍ය අංගයකින් තොර වූ දෙයක් වැන්න.

පෙර දැක්වූ පරිදි සංස්කෘතිය යනු නිරන්තරයෙන් වෙනස් වන්නකි. එහෙත් සංස්කෘතියක් සතු අගනා සාරධර්ම කාලයට උචිත ලෙස යම් සංශෝධනයකින් යුතුව අනුගමනය කරනු විනා ඒවා යල් පැනගිය හණමිටි අදහස් ලෙස ඉවත් කිරීමට දරන ප්‍රයත්නය සැබවින්ම ඛේදනීය තත්වයක් උදා කර ලනු ඇත. ලෝකය පුරා විහිදී, පැතිරී පවතින ඇතැම් ප්‍රවණතා, විවිධ විලාසිතා තමන්ට ගැළපේද, නැද්ද යන්න නොසිතා නොබලා කටයුතු කිරීමට බාල පරපුර යොමු වුවහොත් එමගින් ඔවුන්ට පමණක් නොව සමස්ත ජාතියටම, සංස්කෘතියටම වන්නේ අයහපතකි.

සාහිත්‍ය ගැන හදාරද්දී අප විශේෂ අවධානයක් ගැහැනියකගේ ඇඳුම් පැළඳුම්වල මනා සංවර බවක් අපේක්ෂා කරනු ලැබීය.

"නාභිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා
නොපව තන සක්වා - සිනා නොමසෙන් දසන් දක්වා "

අපේ පැරණි චිත්‍ර ශිල්පීන් ඇඳි සිතුවම්වල තිබූ කාන්තා රූප සම්බන්ධයෙන් මෙම කරුණු කොතෙක් දුරට අනුගමනය කර ඇද්ද යන ප්‍රශ්නය එක් අතකින් නැගෙද්දී, ගැහැනියගේ රූපලාවණ්‍යය හා සෞන්දර්යය මතු කර දැක්වීමේ අවශ්‍යතාව ගැන ද අපගේ අවධානය යොමු විය යුතු වන්නේය. කෙසේ නමුදු, එදිනෙදා ජීවිතයේදී, සාමාන්‍ය කටයුතුවලදී අපේ තරුණ කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් විලාසිතා සම්බන්ධයෙන් සලකා බලද්දී, එදා අප පිළිගත් සාරධර්ම හා යහගුණ අද බාල පරපුරට අකැපද යන පැනය යන්තමින් හෝ මතු වී එන බව කිව යුතුමය.

වත්මන් බටහිර සමාජය කාන්තාවක් අගය කිරීමට හා මැනීමට යොදාගන්නා කෝදුව වන්නේ ඇය කොතරම් දුරට ලිංගික ආකර්ෂණයෙන් යුතු කෙනකු ලෙස පෙනී සටිද යන්නයි. ඊට හාත්පසින් වෙනස් වූ මිනුම් දණ්ඩකින් අපේ වැඩිහිටියෝ යහපත් කාන්තාව පිළිබඳ ඇගයීමක් කළහ. ගැමි පරිසරය තුළ අද වුවත්, "සීදේවි" ගෑනු ළමයාට හිමි වන්නේ ඉහළ තැනකි, වැඩි ඇගයීමකි. මෙම තත්වය අපේ වත්මන් තරුණ පෙළ කොතෙක් දුරට පිළිගනීද යන්න කිව නොහැකිය. ගැහැනු ළමයකුගේ ආලේප ගල්වාගෙන, කේශ කලාපයෙහි මල් ගසාගෙන වයමින් හෝ රඟමින් සිටි සිහින් සිරුරු ඇති සුන්දර කාන්තාවන්ගේ රූ සපුවයි.

වත්මන් තරුණ පෙළ ඇඳුම හා සංවර බව එකට ගළපාගන්නට යොමු නොවන්නේ ද එදා අප උගත් සාරධර්ම ගැන වැඩි තැකීමත් නොමැතිව දැයි කිව නොහැකිය. සුකොමල ගැහැනු රුවක් සැබවින්ම හැඩිදැඩි පිරිමි රුවකට වඩා වෙනස් දසුනක් මතු කරලයි. බොහෝ ජීවන ක්‍රියාවලදී මෙන්ම කලා නිර්මාණ සම්බන්ධයෙන් වුව කාන්තාව සබැඳෙනුයේ සියුමැලි, මටසිලිටි, තැන්පත් බව සමගය. එවන් ස්වභාවයක් උපතින්ම ලබා සිටින අපගේ තරුණ දියණියන් ඊට බොහෝ දුරට පටහැනිව යමින්, හුදෙක් විලාසිතා අනුගමනය කිරීමේ පරමාර්ථයෙන්ම, පෙර කී 'ඖචිත්‍යය' ගැන මඳකුදු නොතකා ඇඳුම් පැළඳුම් හා හැසිරීම ද ඇවතුම් පැවතුම් ද සකස් කරගැනීමට යොමු වීම ගැන කිසියම් අප්‍රසාදයක් පොදුවේ සමාජය තුළ පවතින බව සැබෑය.

අප, සාම්ප්‍රදායික ගැමි සංස්කෘතියෙන් උරුම කරගෙන සිටින කළගුණ සැලකීම වැනි ගුණාංග මෙන්ම වගකීම් ඉටු කිරීමේ ලක්ෂණ ද බාල පරපුරේ ඇතමුන්ගෙන් ගිලිහී යන බවක් දක්නට ඇත. යම් කිසිවකු තමා වෙනුවෙන් කරන උපකාරයක් කෘතගුණ පූර්වකව සැලකීමට, එය ප්‍රකාශ කිරිමට යොමු නොවන කවුරුන් හෝ සමාජයේ 'යහපත්' යන අංශයට නොවැටෙනු ඇත. තමන් භාරගන්නා කවර වගකීමක් වුව හරි ආකාරයෙන් ඉටු කිරීම කළ යුත්තක් බව නොසිතන ඇතැම් තරුණ තරුණියන් අද අපට හමු වන අවස්ථා ඇත. මෙවැනි තත්වයක් දැනෙන මොහොතක් පාසා වැඩිහිටි සිත් සසල වන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

යම් කිසිවකු තමන් හට කළ යහපතක් හෝ උපකාරයක් ගැන තමා කෘතඥ වන බව එම පුද්ගලයාට ප්‍රකාශ නොකොට, නොපෙන්වා සිත තුළ සඟවාගෙන සිටීම, උපමාවකින් දක්වතොත්, කෙනකුට ත්‍යාගයක් දීමට සිතා එය මැනවින් ඔතා තමන් ළඟ තබාගෙන සිටීම විනා එය ප්‍රදානය නොකිරීමකට සමාන කළහැකිය. අප සතු අගනා සංස්කෘතික සාර ධර්ම ඉදිරියට ගෙන යාමට අපේ බාල පරපුර දිරිගැන්වීම අප කාගේත් විශේෂ වගකීමකි.